# 15 වැනි පරිශිෂ්ටය
# (XV – 4:12)

## සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධරයන් අත්සන් කළ යුතු බැඳුම්කරයේ ආකෘතිය

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතු ය)

**ඇප බැඳුම්කරය**
සියලු දෙනා විසින් මෙයින් දැන ගත යුතුයි.

ප්‍රධාන ණයකරු හැටියට මේ බැඳුම්කරයට අත්සන් කරන ------------------- පදිංචි (1) -------------------------- වන මා ද, ඇපකරුවන් හැටියට මීට අත්සන් කරන --------------------- පදිංචි (2) -------------------- සහ --------------------- පදිංචි (3) ------------------------ යන අප දෙදෙනා ද මෙයින් දන්වා සිටින්නේ (මෙහි මින්මතු අප සැවොම ඇතැම් විට සාමූහික වශයෙන් බන්ධනදායීන් යනුවෙන් හඳුන්වනු ලැබෙත්) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව ඉල්ලා සිටි විට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් (4) ------------------- (රු. ------) ක මුදලක් කොළඹ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට ගෙවන බවට අප සැවොම එක්ව හා වෙන් වෙන්ව මෙයින් තරයේම බැඳී සිටින බව හා එකී මුදල සත්‍ය ලෙස හා නිසි ලෙස ගෙවන බවට එකී බන්ධනදායීන් වන අප සියලු දෙනාම එක්ව හා වෙන් වෙන්ව බැඳෙන අතරම, පිළිවෙළින් අප එක් එක්කෙනාගේ උරුමක්කාරයන්, පොල්මඃකාරයන් හා අද්මිනිස්ත්‍රාසිකාරයන් ද මෙයින් තරයේ බැඳ තබන බව ය. තවද එකී ඇපකරුවන් වන (2) ------------------------සහ (3) ------------------------ යන අප දෙදෙනා මේ ලියවිල්ලට අත්සන් කරන්නේ "බෙනිපිකූයුම් ඕඩිනිස් ඩිවිසියෝනිස් එට් එක්ස්කසියෝනිස්" හෙවත් බෙදා ගෙවීමේ හා පිළිවෙළින් අයකර ගැනීමේ වාසියත්, ඇපකරුවන්ට නීතියෙන් හිමි වෙනත් සියළුම ඵල ප්‍රයෝජන, වරප්‍රසාද හා ව්‍යතිරේකයනුත් අත්හැර දමමිනි. එකී පාඨයේ බලයත්, එම වාසිය අත්හැර දැමීමේ විපාකත් අපගේ නීතිඥ තැන්පත් ------------------------ මහතා විසින් අප එක් එක්කෙනාට තේරුම්කර දෙන ලදින් දැන් අපට එහි යථාර්ථය සම්පූර්ණයෙන්ම වැටහී ඇති බව ද මෙයින් පිළිවෙළින් ප්‍රකාශ කරමු.

(1) අභ්‍යාසලාභියාගේ සම්පූර්ණ නම

(2) සහ (3) ඇපකරුවන් දෙදෙනාගේ සම්පූර්ණ නම්

(4) දණ්ඩන මුදල

වර්ෂ දෙදහස් --------------------- ක් වූ -------------------- මස ------------ වැනිදා වන මෙදින කොළඹ දී අත්සන් කරන ලදී.

එකී (1) ------------------------ නමැත්තා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් පෙනී සිටින ------------------------ සමග අත්සන් කොට ඇති වර්ෂ දෙදහස් ------------------ ක් වූ ------------- මස -------------------- වැනිදා වන මෙදින ----------------------- දරන ගිවිසුම් පත්‍රය අනුව එකී (1) ----------------------- නමැත්තා ----------------- දින දරන ඉහත කී ගිවිසුමේ නියම කර ඇති පරිදි ----------------- කාලයක් තුළ (5) ------------දී අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට එකඟ වී ඇති හෙයින් ද,

(5) ඉගෙනීමට යන රට

එසේම එකී (1) --------------------- නමැත්තා එකී ගිවිසුමෙහි සඳහන් වගන්තිය හා කොන්දේසි විධි වූ පරිදිත්, අවංකවත් ඉටුකරන බවට රුපියල් --------------ක මුදලක් (රු. ---------------) සඳහා බැඳුම්කරයක් ----------------- විසින් අනුමත කරන ලද ඇපකරුවන් දෙදෙනෙකු ද ඇතිව ලියා අත්සන් කර දිය යුතු බවට එකී ගිවිසුමේ සඳහන් කොට එසේ කරන බවට එකී ගිවිසුමෙන් එකී (1) -------------- නමැත්තා එකඟ වී ඇති හෙයින් ද,

එසේම එකී (2) ------------------------- සහ ------------------------- යන දෙදෙනා එකී ගිවිසුම කියවා බලා මෙයට ඇපකරුවන් වීමට එකඟ වී ඇති හෙයින් ද,

ඉහත කී බැඳුම්කරයේ හෙවත් බන්ධන පත්‍රයේ වග හැටි නම්, ඉදින් එකී (1) ------------------------- නමැත්තා එකී ගිවිසුමෙහි අඩංගු වන නියමයන් හා කොන්දේසි අවංකව ඉටු කළහොත් හෝ, එකී (1) ------------------------- විසින් එකී ගිවිසුමෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි කඩ කරනු ලැබුවහොත් එසේ කඩ කිරීම නිසා ගෙවිය යුතු ඉහත කී රුපියල් (4) ------------------------- ක මුදල (රු. -------------) එකී (1) ---------------------- විසින් හෝ ---------------------- පදිංචි (2) -------------------- හා ---------------------- පදිංචි (3) -------------------- යන අය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට ගෙවනු ලැබුවහොත් හෝ එවිට මේ බැඳුම්කරය හෙවත් බන්ධනපත්‍රය අවලංගුව බල රහිත වන බව හා එකී කොන්දේසි ඒ ආකාරයෙන් ඉටු නොවුවහොත් මේ බැඳුම්කරය සම්පූර්ණ බල සහිතව ද වලංගුව ද ක්‍රියාත්මකව ද පවත්නා බව ය.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන පාර්ශ්වකරුවන් විසින් වර්ෂ දෙදහස් --------------------- ක් වූ ----------------------- මස ----------------- වැනිදා වන මෙදින කොළඹ දී අත්සන් තබන ලදී.

ප්‍රධාන ණයකරුගේ අත්සන : -------------------------
පළමුවැනි ඇපකරුගේ අත්සන : -------------------------
දෙවැනි ඇපකරුගේ අත්සන : -------------------------

**සාක්ෂිකරුවෝ :**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

ඉහත නම් සඳහන් ඇපකරුවන් ඉහත ලිඛිත බැඳුම්කරය අත්සන් කිරීමට පෙර "බෙනිපිකියුම් ඕඩිනිස් ඩිවිසියෝනිස් එට් එක්ස්කසියෝනිස්" යන පාඨයෙහි අර්ථයත් එම වාසිය අත්හැර දැමීමේ විපාකත්, මවිසින් ඔවුන්ට විධි වූ පරිදි තේරුම් කර දෙන ලද බව මෙයින් සහතික කරමි.

---------------------
ඇපකරුවන්ගේ නීතිඥ